කො/ දේවි බාලිකා විද්‍යාලය - කොළඹ
පළමු වාර පරීක්ෂණය - 2016 (මාර්තු)

බුද්ධ ධර්මය

10 ශ්‍රේණිය

කාලය පැය 2 යි

- නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.

01) බෝසතාණන් වහන්සේ තමාගේ අවසන් උපත සඳහා සුදුසු පසුබිම නුවණින් විමසා බැලීම හඳුන්වනු ලබන්නේ කවර නමකින් ද ?

i. පංච බල
ii. පස් කම් සැප
iii. පංච මහා විලෝකනය
iv. පංච අභිඥාව

02) බෝසත් උපත සිදු වූ විගස දක්නට නොලැබුණු ආශ්චර්යමත් සිදුවීමක් වන්නේ

i. උදාන වාක්‍ය පැවසීම
ii. සත් පියුම් පිපීම
iii. පියවර තැබීම
iv. සිංහනාද පැවැත්වීම

03) භද්දකච්චායනා කුමරිය ලෙස හඳුන්වනු ලබන්නේ

i. මහා ප්‍රජාපතිගෝතමීයන්
ii. සුජාතාවන්
iii. මහා මායාවන්
iv. යසෝදරාවන්

04) බුදුරජාණන් වහන්සේ සියලු කෙලෙසුන්ගෙන් දුරු වූ හෙයින් ද , රහසින්වත් පව් නොකළ හෙයින් ද .................................... නම් වන සේක. හිස්තැනට සුදුසු වචනය වන්නේ,

i. සුගතෝ
ii. අරහං
iii. බුද්ධෝ
iv. භගවා

05) සංඝ රත්නයේ ගුණ අතර නිවැරදි ධර්ම මාර්ගය අනුගමනය කිරීමෙහි යෙදුණු යන අර්ථය සහිත සඟ ගුණය නම්

i. සාමීචිපටිපන්න
ii. ආහුණෙය්‍ය
iii. පාහුණෙය්‍ය
iv. ඤායපටිපන්න

06) ගිහියාට අයත් නිත්‍ය සීලය වන්නේ

i. ආජීව අෂ්ටමක සීලය
ii. දස සීලය
iii. පඤ්ච සීලය
iv. අෂ්ටාංගික උපෝසථ සීලය

07) ජලය කැළඹී ඇත්නම් ඒ තුළ කිසිවක් නොපෙනේ. සිතෙහි පවතින මෙම ස්වභාවය පංචනීවරනයන්හි හැඳින්වෙන්නේ

i. ථීන මිද්ධ
ii. උද්ධච්ච කුක්කුච්ච
iii. විචිකිච්චා
iv. ව්‍යාපාදය

5

08) ආර්ය අෂ්ටාංගික මාර්ගයේ සම්මා වාචා, සම්මා කම්මන්ත, සම්මා ආජීව අනුව හික්මීම යනු,

i. ප්‍රඥාවයි
ii. සමාධියයි
iii. විදර්ශනාවයි
iv. ශීලයයි

09) සම සතළිස් කර්මස්ථාන තෝරා ගැනීමේදී ඒ සඳහා බලපාන චරිත හයක් බුදු දහමේ දැක්වේ. එම චරිත ගණයට අයත් නොවන චරිතය වන්නේ,

i. මෝහ චරිත
ii. ප්‍රඥා චරිත
iii. බුද්ධි චරිත
iv. රාග චරිත

10) භාවනාවට පිවිසෙන තැනැත්තා විසින් ඉටුකර ගත යුතු පූර්ව අවශ්‍යතා ගණන වන්නේ,

i. දෙකකි
ii. හතරකි
iii. පහකි
iv. අටකි

11) නිසි මඟ පෙන්වීමක් නොලබා භාවනා කොට ප්‍රතිඵල නොලැබූ සැරියුත් හිමියන්ගේ ගෝල නමක් වූයේ

i. ස්වර්ණකාර හිමි
ii. වක්කලී හිමි
iii. චූල්ලපන්ථක හිමි
iv. පුණ්ණ හිමි

12) ''ගෞතමයන් වහන්ස ඇතුළත අවුල්ය. සත්ව ප්‍රජාව අවුලෙන් වෙලී සිටී.'' මෙසේ එක්තරා දෙවියෙක් බුදුන් වහන්සේගෙන් විමසන්නේ

i. නිග්‍රෝධාරාමයේ දී
ii. වේළුවනාරාමයේ දී
iii. පූර්වාරාමයේ දී
iv. ජේතවනාරාමයේ දී

13) විදර්ශනා භාවනාව හඳුන්වන වෙනත් නමක් වන්නේ

i. බුද්ධානුස්සති භාවනාව
ii. ත්‍රිලක්ෂණ භාවනාව
iii. සමාධි භාවනාව
iv. ආනාපානසති භාවනාව

14) ලෝකය හා සත්වයා යනු ස්කන්ධ සමූහය කි. බුදුරජාණන් වහන්සේ පැහැදිලි කර ඇති අන්දමට එම ස්කන්ධ ගණන

i. පහකි
ii. හතරකි
iii. තුනකි
iv. අටකි

15) තිලකුණු පිළිබඳ අවබෝධයෙන් යුතුවන්නා අසීමිත ආශාවෙන් තොර වෙයි. මෙහි දැක්වෙන අසීමිත ආශාව යන්නට සමාන වචනයක් වන්නේ,

i. අල්පේච්ඡතාව
ii. සුභර බව
iii. මහිච්ඡතාව
iv. සන්තුට්ඨික බව

16) සියම් රටෙන් උපාලි මහතෙරුන් ප්‍රමුඛ උපසම්පදා භික්ෂූන් වහන්සේලා විසිනමක් ලංකාවට වඩින ලද්දේ,

i. වලගම්බා රජ සමයේ
ii. කීර්ති ශ්‍රී වික්‍රමසිංහ රජ සමයේ
iii. මහසෙන් රජ සමයේ
iv. කීර්ති ශ්‍රී රාජසිංහ රජ සමයේ

17) සසුන රැක ගැනීමේ අරමුණින් ''සිල්වතුන්ගේ සංගමය'' පිහිටුවන ලද්දේ

i. හික්කඩුවේ සුමංගල හිමි
ii. වැලිවිටියේ සෝරත හිමි
iii. මීගෙට්ටුවත්තේ ගුණානන්ද හිමි
iv. වැලිවිට සරණංකර හිමි

18) සම්බුද්ධ ශාසනයට විශාල සේවයක් කළ දුටුගැමුණු රජතුමා රජකම් කළ කාලය

i. වසර 24 කි
ii. වසර 22 කි
iii. වසර 26 කි
iv. වසර 20 කි

19) 'හික්මීම' හා 'ප්‍රමාද නොවීම' යන්නෙහි අර්ථය දැක්වෙන වරණය වන්නේ

i. අප්පමත්ත නිසම්මකාරී
ii. නිසම්මකාරී සද්ධාන
iii. සද්ධාන , අප්පමත්ත
iv. සුචිකම්ම , අප්පමත්ත

20) වැලිවිට අසරණ සරණ සිරි සරණංකර සංඝරාජයාණන් වහන්සේ විසින් රචිත ධර්ම ශාස්ත්‍රය ග්‍රන්ථයක් නොවන්නේ

i. මුණිගුණාලංකාරය
ii. බුදුගුණ ලංකාරය
iii. සතර බණවර සන්නය
iv. සාරාර්ථ සංග්‍රහය

(ලකුණු 2 x 20 = 40)

## 2 - කොටස

- පළමුවන ප්‍රශ්නය ඇතුළු ප්‍රශ්න පහකට පිළිතුරු ලියන්න.
- පළමුවන ප්‍රශ්නයට ලකුණු 20 ක් ද අනෙක් ප්‍රශ්නය සඳහා ලකුණු 10 හිමිවේ

01) කෙටි පිළිතුරු සපයන්න.

i. සිදුහත් කුමරු ඥාතීන් ඉදිරියේ ශිල්ප දැක්වීමේ දී සුවිශේෂී නිපුණතා පෙන්වූ ශිල්ප දෙක ලියන්න.
ii. ''රහසත් පව් නොකොට'' යන පද්‍ය සම්පූර්ණ කරන්න.
iii. පංච නීවරණ ධර්ම දෙකක් ලියන්න.
iv. භාවනාවට යොමුවන පුද්ගලයා ඉටු කර ගත යුතු පූර්ව අවශ්‍යතා දෙකක් ලියන්න.
v. ලෝකය හා ජීවිතය පිළිබඳව අපට ඇතිකර ගත හැකි දෙයාකාර අවබෝධය නම් කරන්න.
vi. සිව්පසයේ අඩංගු කරුණු දෙකක් ලියන්න.
vii. විදර්ශනා යන්නෙහි අර්ථය සහිත ගාථා පාඨය ලියන්න.
viii. වැලිවිට අසරණ සරණ සරණංකර හිමිගෙන් අපට ලබාගත හැකි ආදර්ශ දෙකක් ලියන්න.
ix. ''උට්ඨානවතෝ සතිමතෝ'' ගාථාවෙහි දැක්වෙන පරිදි යසස වැඩෙන පුද්ගලයාගේ ලක්ෂණ 02 ක් ලියන්න.
x. ''ආරභථ නික්ඛමථ - යුඤ්ජථ බුද්ධ ශාසනේ මෙම පාලි පාඨයෙහි සිංහල තේරුම ලියන්න.

(ලකුණු 2 x 10)

02) බෝසතුන් වහන්සේගේ චරිතය අභියෝගවලින් පිරී පැවති එකකි.

i. බෝසතුන් වහන්සේ අභියෝග ජයගත් අවස්ථා දෙකක් ලියන්න.

ii. එම අවස්ථාවක් කෙටියෙන් පැහැදිලි කරන්න.

iii. ශිෂ්‍යයෙකු ලෙස විවිධ අභියෝගවලට මුහුණදීමේ දී බෝ සතුන් අභියෝග ජයගත් ආකාරය ඔබට වැදගත් වන්නේ කෙසේදැ යි පැහැදිලි කරන්න.

03)

i. සුවිසි ගුණ බුද්ධ, ධම්ම, සංඝ ගුණ ලෙස බෙදා දක්වන්න.

ii. සඝ ගුණ දෙකක් ලියා අර්ථ පැහැදිලි කරන්න.

iii. ආගමික සාමාජික ජාතික වශයෙන් සංඝ සමාජයෙන් වන සේවාවන් පිළිබඳ විස්තරයක් කරන්න.

04)

i. භාවනාව යන්න පැහැදිලි කරන ගාථා පාඨය ලියන්න.

ii. බෞද්ධ භාවනාව සඳහා යොමු වන පුද්ගලයා තුළ තිබිය යුතු ගුණාංග තුන කවරේ ද ?

iii. සමථ භාවනාවෙන් පිළිබඳ විස්තර කරමින් එයින් ලබා ගත හැකි ප්‍රයෝජන පිළිබඳ පෙළපොත ඇසුරෙන් කරුණු දක්වන්න.

05)

i. විදර්ශනා භාවනාව පැහැදිලි කරන පාලි පාඨය ලියා එහි අරුත ලියන්න.

ii. ''යථාභූතඥාණ දස්සනය'' යන්න පැහැදිලි කරන්න.

iii. ත්‍රිලක්ෂණ පිළිබඳ අවබෝධ මෙලොව ජීවිතය සාර්ථකත්වයට හේතුවන අයුරු පැහැදිලි කරන්න.

06)

i. වැලිවිට අසරණ සරණ සරණංකර හිමියන්ගේ ගිහිකල නම කුමක්ද ?

ii. සරණංකර හිමියන්ගේ ශාසනික සේවාවන් දෙකක් ලියා පැහැදිලි කරන්න.

iii. ''අඳුරු යුගයේ මිණි පහන'' යන මැයෙන් සරණංකර හිමි පිළිබඳව පාසල් සඟරාවකට ලිපියක් ලියන්න.

07)

i. උට්ඨාන මතෝ සතිමතෝ - ගාථාව සම්පූර්ණ කරන්න.

ii. එහි අරුත පැහැදිලි කරන්න

iii. මෙහි දැක්වෙන කරුණු පුද්ගලයෙකු දියුණු තත්වයකට පත්කරන අයුරු පැහැදිලි කරන්න.